ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2061/7 – 2018 මාර්තු 05 වැනි සඳුදා – 2018.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන නිවේදනයයි

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (422 අධිකාරය) 10 (සී) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද රෙගුලාසියකි.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි,
මුදල් මණ්ඩලයේ සභාපති සහ අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

2018 ක් වූ මාර්තු මස 05 වැනි දින,
කොළඹ දීය.

මුදල් තැරැව්කරණ රෙගුලාසි

1. 2018 මාර්තු මස 5 වැනි දින සිට බලපැවැත්වෙන මෙම රෙගුලාසි ''**2018 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි**'' යනුවෙන් හැඳින්විය යුතුය. 2016 ජුනි මස 01 වැනි දින අංක 1969/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කරන ලද 2013 පෙබරවාරි 08 දින අංක 1796/21 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2013 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි, 2018 මාර්තු මස 05 වැනි දින සිට අවලංගු වේ. *(උධෘතය සහ වලංගු දිනය)*

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ (මින් පසුව ''මහ බැංකුව'' ලෙස හඳුන්වනු ලබන) මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ ''බලය පැවරීමේ සහතිකය'' යටතේ වූ අවසරයකින් තොරව, කිසියම් පුද්ගලයෙකු විසින් හෝ වෙනත් පුද්ගලයෙකු යොදවා හෝ මුදල් තැරැව්කරණ ව්‍යාපාර කටයුතු සිදු නොකළ යුතුය. *(බලය පැවරීමේ සහතිකය)*

3. ඉහත 2 වැනි රෙගුලාසිය ප්‍රකාරව ''බලය පැවරීමේ සහතිකය'' අයදුම් කිරීමට සුදුසුකම් ලාභියෙකු වන්නේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලෙස ලියාපදිංචි අවම ප්‍රාග්ධනය රුපියල් මිලියන දහයකට (10,000,000) සමාන හෝ මුදල් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන එවැනි වෙනත් ප්‍රාග්ධන අවශ්‍යතාවයක් සපුරා ඇති, සීමාසහිත වගකීම් සහිත සමාගමක් පමණි. *(අයදුම් කිරීම සඳහා සුදුසුකම්)*

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීම

4. ''බලය පැවරීමේ සහතිකය'' නිකුත් කිරීම පිළිබඳව සලකා බැලීම පිණිස අයදුම් කරන සමාගම විසින් ''බලය පැවරීමේ සහතිකය'' අයදුම් කිරීම සඳහා මෙම රෙගුලාසිවලින් නිර්දේශිත ආකෘති පත්‍රයට අනුකූලව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් 5 වැනි රෙගුලාසියෙන් නිර්දේශිත අනෙකුත් ලිපි ලේඛන ද සමඟ දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන

5. ''බලය පැවරීමේ සහතිකය'' ලබා ගැනීම සඳහා අයදුම් කරන සමාගම් විසින් දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ විසින් නිර්දේශිත ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය සමඟ, වෙනත් සඳහනක් නොමැති නම්, පහත සඳහන් ලිපි ලේඛන/තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

(අ) සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සහතික කරන ලද සාංගමික ව්‍යවස්ථාවලිය, සංස්ථාගත කිරීමේ සහතිකය සහ පෝරම 20 හි අනුපිටපත්;

(ආ) ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ අනුපිටපතක්;

(ඇ) ප්‍රධාන විධායක නිලධරයා ඇතුළු අධ්‍යක්ෂවරුන්, සැලකිය යුතු කොටස් හිමියන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධරයන් ලෙස පත්කරන ලද පුද්ගලයින්ගේ සම්පූර්ණ නම්, ජාතික හැඳුනුම්පත් අංක සහ/ හෝ විදේශ ගමන් බලපත්‍ර අංක, පදවි නාම, පෞද්ගලික ලිපිනයන්, සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ තොරතුරු;

(ඈ) ඩී ඕ ඩී/ එම් බී/ 002 පෝරමය (උපලේඛනය I සහ II) අනුව ප්‍රධාන විධායක නිලධරයා, සැලකිය යුතු කොටස් හිමියන්, ප්‍රධාන කළමනාකරණ නිලධරයන් සහ අධ්‍යක්ෂවරුන් ලෙස පත්කරන ලද පුද්ගලයින්ගේ දිවුරුම් ප්‍රකාශන;

(ඉ) ඉහත රෙගුලාසි අංක 4 අනුව ඉදිරිපත් කරන අයදුම් පත්‍රයේ සඳහන් තොරතුරුවල නිවැරදි බව සහ සාංගමික ව්‍යාවස්ථාවලියෙහි මුදල් තැරැව්කරණය පිළිබඳව සඳහන් නොවන අවස්ථාවලදී, අයදුම් කරන සමාගමට ව්‍යාපාරික කාර්යයක් වශයෙන් මුදල් තැරැව්කරණයේ යෙදීමට බලය ලබා දී ඇති බව තහවුරු කරමින් ඉදිරිපත් කරන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා පත්‍රය;

(ඊ) සමාගම ස්වකීය අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා ඇති බවට ලේඛනගත සාක්ෂි;

(උ) ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මේ අනුපිටපත් සහ;

(ඌ) දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ විසින් විශේෂයෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් ඕනෑම තොරතුරක්.

සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාවය

6. බලය පැවරීමේ සහතිකය නිකුත් කිරීම සඳහා අයදුම් කරනු ලබන අයදුම්පත්‍රයෙහි හෝ ඒ හා සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන වෙනත් ඕනෑම ලේඛනයක හෝ මෙම රෙගුලාසි යටතේ ''බලය පැවරීමේ සහතිකය'' නිකුත් කිරීම සඳහා යෝග්‍යතාව නිශ්චය කිරීම පිණිස පවත්වනු ලබන ඕනෑම විමර්ශණයක දී හෝ විභාගයක දී, දී ඇති ඕනෑම තොරතුරක් අසත්‍ය හෝ අසම්පූර්ණ හෝ වැරදි සහගත බව හැඟී ගියහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීම, බලය පැවරීමේ සහතිකය අවලංගු කිරීම හා/හෝ මුදල් මණ්ඩලය විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන එවැනි වෙනත් ඕනෑම ක්‍රියාමාර්ගයකට යටත් වීමට අයදුම්කරුට/ මුදල් තැරැව්කරණ සමාගමට සිදුවනු ඇත.

වාර්ෂික සහතික පත්‍ර ගාස්තු

7. (අ) සෑම බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක් විසින් ම මුදල් මණ්ඩලය විසින් වරින් වර තීරණය කරන ලද වාර්ෂික සහතික පත්‍ර ගාස්තුවක් සහ වෙනත් ඕනෑම ගාස්තු මහ බැංකුවට ගෙවිය යුතුය.

(ආ) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් ගෙවිය යුතු ගාස්තු සහ අදාළ වෙනත් උපදෙස්, දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ විසින් වරින් වර චක්‍රලේඛ මගින් ඔවුන්ට දැනුම් දෙනු ඇත.

මුදල් තැරැව්කරණ ව්‍යාපාරය අවසන් කිරීම

8. (අ) කිසියම් බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක් තම ව්‍යාපාර කටයුතු අවසන් කිරීමට තීරණය කරන්නේ නම්, ව්‍යාපාරය අවසන් කිරීමට මාස තුනකට (03) පෙර ඒ පිළිබඳව දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

(ආ) එවැනි මුදල් තැරැව්කරණ සමාගම් විසින් තම ව්‍යාපාර කටයුතු අවසන් කළ දින සිට වැඩකරන දින තුනක් (03) ඇතුළත මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද ''බලය පැවරීමේ සහතිකය'' ආපසු බාරදිය යුතුය.

9. බලයලත් මුදල් තැරැව්කරණ සමාගම්වලට පහත සඳහන් කටයුතුවල යෙදීමට අවසර ඇත. අවසරලත් කටයුතු

(අ) ශ්‍රී ලංකාවේ සහ වෙනත් පිළිගත් ජාත්‍යන්තර මුදල්, සුරකුම්පත්, විදේශ විනිමය වෙළඳපොළවල ගනුදෙනුකරුවන් සමඟ මූල්‍ය උපකරණ ගනුදෙනු සඳහා ඒජන්තවරයෙකු, පහසුකම් සලස්වන්නෙකු හෝ මැදිහත්කරුවෙකු ලෙස රාජ්‍ය සුරකුම්පත් තැරැව්කරණය හා විදේශ විනිමය තැරැව්කරණය, අන්තර් බැංකු මුදල් තැරැව්කරණය ඇතුළත් මුදල් තැරැව්කරණ ව්‍යාපාර කටයුතු වල නිරත වීම.

(ආ) බලයලත් මුදල් තැරැව්කරණ සමාගමකට මුදල් මණ්ඩලය විසින් කලින් කලට බලය පවරන ලද මුදල් තැරැව්කරණය හා සම්බන්ධ ඕනෑම කටයුත්තක නිරත වීම.

10. මුදල් තැරැව්කරණ ගනුදෙනුවල නිරත බලයලත් මුදල් තැරැව්කරණ සමාගමකට තැරැව්කරණ ගාස්තු, කොමිස් මුදල් හෝ සේවා ගාස්තු ලබා ගැනීමට හිමිකමක් ඇත. තැරැව් කොමිස් සහ ගාස්තු

11. බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක් විසින්: මෙහෙයුම් අවශ්‍යතා

(අ) තැරැව්කරණ ගනුදෙනුවලට අදාළව ඒජන්තවරයෙකු, පහසුකම් සලස්වන්නෙකු හෝ මැදිහත්කරුවෙකු වශයෙන් පමණක් කටයුතු කළ යුතු අතර ප්‍රධානියෙකු ලෙස කටයුතු නොකළ යුතුය;

(ආ) ගෝලීය විදේශ විනිමය රීති සංග්‍රහය (Global FX Code), ඒ. සී. අයි.ආදර්ශ රීති සංග්‍රහය (ACI Model Code)සහ දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද වෙනත් ආචාර ධර්ම සංග්‍රහයක් අනුගමනය කළ යුතුය;

(ඇ) ලැබෙන ඇණවුම්වල කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කිරීම, අදාළ මූල්‍ය උපකරණ සඳහා වූ නියමයන් සහ කොන්දේසි අධීක්ෂණය කිරීම සහ අපේක්ෂිත සහ අසම්පූර්ණ ගනුදෙනු පිළිබඳ වාර්තා තබාගැනීම කළ යුතුය;

(ඈ) මූලික ගිවිස ගැනීමේදී සහ ගනුදෙනුව ක්‍රියාත්මක කිරීමට පෙර, ගනුදෙනුවට පදනම වන්නා වූ සීමාකාරී කොන්දේසි (උදා: ගනුදෙනුවට ගැලපෙන පාර්ශ්ව සොයාගැනීම) පැහැදිලිව සඳහන් කළ යුතුය;

(ඉ) නිශ්චිත සහ පැහැදිලි පාරිභාෂික වචන මාලාවක් සෑම විටම භාවිතා කල යුතු අතර වෘත්තීයමය ආකාරයෙන් කටයුතු කළ යුතුය;

(ඊ) එක් එක් ගිණුම් සඳහා සම්පූර්ණ සහ යාවත්කාලීන වූ වාර්තා පවත්වාගෙන යා යුතුය;

(උ) ගනුදෙනුවක් කිරීම සඳහා දෙපාර්ශ්වයේම කැමැත්ත පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසු පමණක් ගනුදෙනුවට සම්බන්ධ ප්‍රධාන ගනුදෙනුකරුවන්ගේ නම් අනාවරණය කළ යුතුය;

(ඌ) ඕනෑම බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක් සහ/හෝ ගනුදෙනුවකට සම්බන්ධ අනෙකුත් ඕනෑම පාර්ශ්වකරුවන් විසින් අපචාර හෝ විෂම ක්‍රියා සිදුකරන බවට සංඥා/ සාක්ෂි දැනගැනීමට ලැබුනහොත් ඒ පිළිබඳව දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතුය;

(එ) අදාළ මූල්‍ය උපකරණයන් පිළිබඳව අවශ්‍ය කරන මට්ටමේ දැනුමක් ලබාගත යුතු අතර එවැනි මූල්‍ය උපකරණ වලට අදාළ ඉල්ලුම් හා සැපයුම් ප්‍රභවයන් සහ වෙළෙඳපොළ තොරතුරු ප්‍රභවයන්, එවැනි මූල්‍ය උපකරණ වලට අදල කොන්දේසි සහ තත්ත්වයන් පිළිබඳව පූර්ණ නිපුණතාවයකින් සහ අවබෝධයකින් යුක්ත විය යුතුය;

(ඒ) අනෙකුත් පාර්ශවයන් සමග තොරතුරු හුවමාරු කර ගැනීමේදී, විදේශ විනිමය හා මුදල් වෙළෙඳපොළ ගනුදෙනු පිළිබඳව මහ බැංකුව මඟින් නිකුත්කර ඇති රෙගුලාසිවලට අනුකූල විය යුතුය;

(ඔ) සංවේදී තොරතුරු හඳුනාගැනීමට සහ ඒ පිළිබඳව නිසි අවබෝධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය කරන කුසලතා හා දක්ෂතා පිළිබඳව ප්‍රමාණවත් පුහුණුවක් මෙහෙයුම් කාර්ය මණ්ඩලයට ලබා දිය යුතුය;

නිලධරයන්ගේ යථා යෝග්‍යතාවයේ අවශ්‍යතාවය

12. (අ) ප්‍රධාන විධායක නිලධාරී, අධ්‍යක්ෂ හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලවලට අයත් නිලධරයන්ට පමණක් සීමා නොවන පරිදි බලයලත් මුදල් තැරැව්කරණ ආයතනයක කටයුතු සිදුකරන සියලු නිලධරයන් තමන් වගකිව යුතු කාර්යයන් ඉටු කිරීමට යථා යෝග්‍ය පුද්ගලයන් විය යුතු අතර ඒ සඳහා අත්‍යවශ්‍ය වන අත්දැකීම්, සුදුසුකම් හා නිපුණතාවය තිබිය යුතුය.

යථා යෝග්‍ය බව ඇගයීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය

(ආ) එක් එක් බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් ඉහත රෙගුලාසි අංක 12(අ) හි සඳහන් නිලධරයන් සහ සැලකිය යුතු කොටස් හිමියන්ගෙන් උපලේඛන I, II හා III හි දැක්වෙන පරිදි දිවුරුම් ප්‍රකාශ හා අනෙකුත් ප්‍රකාශයන් ලබාගෙන යථා යෝග්‍ය බව ඇගයීම සඳහා, සෑම වසරකම මාර්තු මස 31 දිනට පෙර දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයා වෙත ලබාදිය යුතු ය.

ප්‍රධාන විධායක නිලධාරී, සැලකිය යුතු කොටස් හිමියන්, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයන් සහ අධ්‍යක්ෂවරුන්ගේ යථා යෝග්‍යතාවයේ අවශ්‍යතාවය

(ඇ) දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ විසින් යථා යෝග්‍ය බව ඇගයීමකට ලක්කර අනුමැතිය දෙනතුරු කිසිම පුද්ගලයෙකුට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සහභාගී වීමට හෝ ප්‍රධාන කළමනාකරණ නිලධරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධරයෙකු ලෙස කටයුතු කිරීම හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු බවට පත්වීම හෝ කළ නොහැකිය.

සැලකිය යුතු කොටස් හිමියන්

(ඈ) යම් පුද්ගලයකු සහ ඔහුගේ / ඇයගේ සම්බන්ධිත පාර්ශ්වයන් විසින් බලයලත් මුදල් තැරැව්කරණ ආයතනයක කොටස් හිමිකාරත්වයෙන් සියයට 20 ක හෝ ඊට වැඩි කොටස් හිමිකමක් දරන්නේ නම් ඔහු මෙහි අරමුණු සඳහා සැලකිය යුතු කොටස් හිමියෙකු වශයෙන් සලකනු ලැබේ. සෑම බලයලත් මුදල් තැරැව්කරණ ආයතනයක් විසින්ම තම කොටස් හිමිකරුවෙක්/ හිමිකරුවන් සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු බවට පත් වූ විට එම හිමිකරුගේ නම / හිමිකරුවන්ගේ නම් කඩිනමින් දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු ය.

(ඉ) ඉහත 12 (ඈ) හි සඳහන් "සම්බන්ධිත පාර්ශවයන්" යන්නට ඇතුළත් වන්නේ තනි පුද්ගලයෙක්, හවුලක් වශයෙන් හෝ සංස්ථාපිත මණ්ඩලයක් වශයෙන් සෘජුව හෝ වක්‍රව හෝ වෙනත් නාමිකයකු හරහා හෝ වෙනත් පුද්ගලයෙකු හරහා, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් සමඟ එකතුව හෝ සාමූහිකව අත්පත් කරගත් සියලුම සමාගම් කොටස් ය.

ප්‍රධාන නිලධරයන් හා සැලකිය යුතු කොටස් හිමියන් සඳහා අනුමැතිය.

(ඊ) මුදල් තැරැව්කරණ රෙගුලාසියෙහි, රෙගුලාසි අංක 13 හෝ සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයා විසින් බලයලත් මුදල් තැරැව්කරණ ආයතනයක ප්‍රධාන විධායක නිලධාරී, අධ්‍යක්ෂ, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයෙකු හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු වශයෙන් යෝජිත පත්වීම්, (හෝ අඛණ්ඩව සේවය කිරීම) අවශ්‍ය ලියකියවිලි ලැබී දින තිහක් ඇතුළත අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හේතු සහිතව අදාළ මුදල් තැරැව්කරණ ආයතනයට දැනුම් දිය යුතු ය.

(උ) දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයා විසින් එකී අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම අදාළ බලයලත් මුදල් තැරැව්කරණ සමාගමට දැන්විය යුතු අතර අදළ මුදල් තැරුව්කරණ ආයතනය විසින් එහි ප්‍රධාන විධායක නිලධරයා, අධ්‍යක්ෂ, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයෙකු හෝ සැලකිය යුතු කොටස් හිමියන්ට ඉහත 12 (ඊ) ප්‍රතිඵලය දැනුම් දීම හා ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු ය.

පසුව හඳුනාගත් නුසුදුසු බව දැන්වීම

(ඌ) ප්‍රධාන විධායක නිලධාරී, අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයෙකු

හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු එම තනතුරට නුසුදුසු හෝ යෝග්‍ය නොවන බවට සැක කරන කරුණක් හෝ සොයාගැනීමක් වේ නම් එම කරුණ හඳුනාගත් වහාම සෑම බලයලත් මුදල් තැරැව්කරණ ආයතනයක් විසින් දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතු ය.

(එ) පවතින තත්ත්වයන් යටතේ ප්‍රධාන විධායක නිලධාරී, අධ්‍යක්ෂ, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයෙකු හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු විසින් ලබාදෙන දිවුරුම් ප්‍රකාශවල හෝ ප්‍රකාශවල තොරතුරු වෙනස්වීමකට, අවලංගු වීමකට, අදාළ නොවීමකට හෝ අසත්‍ය වීමකට භාජනය වුවහොත් අදාළ නිලධරයා විසින් වහාම ඒ බව දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතු ය.

(ඒ) රෙගුලාසි 12 (ඊ) යටතේ දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයාගේ ප්‍රතික්ෂේප කිරීම හෝ තීරණය මගින් අගතියට පත්ව සිටින පුද්ගලයෙකුට බලයලත් මුදල් තැරැව්කරණ ආයතනය විසින් එකී තීරණය දැනුම් දී දින දාහතරක් (14) ඇතුළත හේතු සහිතව ලිඛිත අභියාචනයක් මුදල් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. මුදල් මණ්ඩලය වෙත කෙරෙන අභියාචනය

(ඔ) මුදල් මණ්ඩලය විසින් දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයා වාර්තා කරන ලද කරුණු හා අගතියට පත් පාර්ශවයේ විරෝධතා සැලකිල්ලට ගෙන දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයාගේ ප්‍රතික්ෂේප කිරීමේ තීරණය තහවුරු කිරීම හෝ නිශ්ප්‍රභා කිරීම කළ හැකිය.

13. බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධරයා, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයෙකු හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු ලෙස තෝරා ගැනීමට සහ / හෝ පත්කිරීමට හෝ එවැනි පුද්ගලයෙකු එවැනි තනතුරක් දැරීමට හෝ සුදුස්සෙක් නොවන්නේ එවැනි යම් පුද්ගලයෙකු: ප්‍රධාන නිලධරයෙකු සහ සැලකිය යුතු කොටස් හිමියෙකු වශයෙන් පත් වීමට ඇති නුසුදුසුකම්.

(අ) මුදල් තැරැව්කරණ කටයුතු, මූල්‍ය, නීති, ව්‍යාපාර හෝ පරිපාලන කටයුතු හෝ ඒ හා සම්බන්ධ කිසියම් වෘත්තියක් පිළිබඳ අධ්‍යාපනික හෝ වෘත්තීමය සුදුසුකම් හෝ ඵලදායී පළපුරුද්දක් ලබා නොමැති නම්;

(ආ) ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී යම් අධිකරණයකින් බුන්වත්භාවයෙන් නිදහස් නොකෙරෙනු තැනැත්තකු හෝ බුන්වත්භාවයට පත් වූ තැනැත්තකු ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(ඇ) සදාචාර විරෝධී කටයුතු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් වරදකරුවෙකු කර ඇත්නම්;

(ඈ) යම් අධිකරණයක් විසින් ලබාදෙන තීන්දුවක් හෝ නියෝගයක් ප්‍රකාරව ගෙවිය යුතු වූ ණය මුදලක් ගෙවීමට අපොහොසත් වී ඇත්නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලීසිය, යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීයමය සංවිධානයක්, යම් පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයක් හෝ විසින් වංචාවක්, රැවටීමක් හෝ වංක ක්‍රියාවක් වන යම් ක්‍රියාවක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව සිදුකරන විමර්ශනයකට හෝ විභාග කිරීමකට භාජනය වෙමින් සිටී නම්;

(ඊ) එසේ පත්කරගනු ලැබීමට හෝ තෝරා පත්කරගනු ලැබීමට පෙර අවුරුදු පහළොවක (15) කාලසීමාවක් ඇතුළත යම් අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීමය සංවිධානයක්, පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයක් හෝ විසින් වංචාවක්, රැවටීමක් හෝ වංක ක්‍රියාවක් වන යම් ක්‍රියාවක් හෝ වෙනත් ඒ සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව වරදකරු කරනු ලැබ ඇත්නම්;

(උ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක් විසින් යම් සංස්ථාපිත ආයතනයක අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධරයෙකු, හෝ වෙනත් නිලධරයෙකු ලෙස සේවය කිරීමෙන් ඉවත් කරනු ලැබූ හෝ සේවය අත්හිටුවනු ලැබ ඇත්නම්;

(ඍ) වංචාවක්, රැවටීමක් හෝ වංක ක්‍රියාවක් වන යම් ක්‍රියාවක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාවක වරදකරුවෙකු ලෙස අධිකරණ ක්‍රියාමාර්ගයකට භාජනය වෙමින් සිටින්නෙකු නම්;

(එ) නිසි අධිකරණ බලයක් සහිත අධිකරණයක් විසින් සිහි විකල් තැනැත්තෙකු ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇති තැනැත්තෙකු නම්;

(ඒ) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හා/ හෝ ප්‍රාථමික වෙළෙඳ ආයතනයක ප්‍රධාන විධායක නිලධරයෙකු, අධ්‍යක්ෂවරයෙකු හෝ වෙනත් ඕනෑම බලතල සහිත නිලයක් දරන තැනැත්තෙකු නම්.

තැරුවිකරණ ව්‍යාපාර මත පාලනයක් අත් පත් කර ගැනීමේ සීමා

14. බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හා/ හෝ ප්‍රාථමික අළෙවිකරුවෙකු විසින් බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක, කොටස් හෝ ස්කන්ධ නොදැරිය යුතු සේම, මුදල් තැරැව්කරණ සමාගමේ අධ්‍යක්ෂවරු හෝ ප්‍රධාන නිලධරයන් පිළිබඳව පාලනයක් අත්පත් කර ගැනීම නොකළ යුතුය.

අභ්‍යන්තර පාලනයේ අරමුණු

15. පහත දැක්වෙන අරමුණු ඉටුකර ගැනීම පිණිස සෑම බලයලත් මුදල් තැරුව්කරණ සමාගමක් විසින්ම දෘඩි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යා යුතුය.

(අ) මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය සහ සඵලතාවය (මෙහෙයුම් අරමුණු);

(ආ) මූල්‍ය හා කළමනාකරණ තොරතුරුවල විශ්වාසනීයත්වය සහ පරිපූර්ණ බව (තොරතුරුමය අරමුණු); සහ

(ඇ) අදාල නීති සහ රෙගුලාසි සමඟ අනුකූලතාවය (අනුකූලතා අරමුණු).

අභ්‍යන්තර පාලනය

16. ඉහත 15 වැනි රෙගුලාසියෙහි සඳහන් වන අභ්‍යන්තර පාලන පද්ධතියට පහත සඳහන් දේ ඇතුළත් විය යුතුය.

(අ) අභ්‍යන්තර පාලන පද්ධතිය නිතිපතා සමාලෝචනය කිරීම සහ /හෝ යාවත්කාලීන කිරීම, කළ යුතු අතරම සියලුම මෙහෙයුම් කාර්ය මණ්ඩලය එම පද්ධතිය පිළිබඳව මනා අවබෝධයකින් යුතුව ඊට අනුකූලව කටයුතු කළ යුතු බවට සහතික විය යුතුය;

(ආ) මෙම රෙගුලාසිවල අරමුණු සපුරා ගැනීම සඳහා, අවම වශයෙන් වසර හයක (06) කාලයක් තුළ සියලු ගනුදෙනුවල විධිමත් වාර්තා, පැහැදිලි ලිඛිත සාක්ෂි ද සමඟ විද්‍යුත් හෝ වෙනයම් ආකාරයකට පවත්වාගෙන යා යුතුය;

(ඇ) ඉහත 9 වැනි රෙගුලාසියෙහි සඳහන් කාර්යයන් ඉටුකිරීම සඳහා සම්බන්ධිත දුරකථන මාර්ග පමණක් ම භාවිතා කළ යුතුය;

(ඈ) ඉහත 16(ඇ) වැනි රෙගුලාසියෙහි සඳහන් දුරකථන සංවාද වාර්තා (හඬ තැටි) එම දුරකථන සංවාද දිනයේ සිට වසර හයකට (06) නොඅඩු කාලයක් පවත්වාගෙන යා යුතුය;

(ඉ) දුරකථන සංවාද වාර්තාවලට භෞතික ප්‍රවේශය සඳහා දෘඩි පාලන පද්ධතියක් පවත්වාගෙන යා යුතුය;

(ඊ) සියලුම සේවා නියුක්තිකයන් හට මෙහෙයුම් පරිශ්‍රය තුළ පෞද්ගලික ජංගම දුරකථන භාවිතා කිරීම තහනම් කළ යුතුය.

17. බලයලත් මුදල් තැරුව්කරණ සමාගමක් විසින් ගනුදෙනුවක් සිදුවී විනාඩි පහළොවක් (15) ඇතුළත සියලු ගනුදෙනු අදාළ පාර්ශ්වකරුවන්ට ලිඛිතව තහවුරු කළ යුතු අතර එම සෑම තහවුරුවකම පහත සඳහන් අවම තොරතුරු ඇතුළත් විය යුතුය. තැරුව්කරණය තහවුරු කිරීම

(i) ගනුදෙනුව සිදුවූ වේලාව, දිනය සහ එහි වලංගු දිනය;

(ii) අදාළ ගනුදෙනුකාර පාර්ශවයන්හි නම්;

(iii) පියවීම් උපදෙස්; සහ

(iv) මුදල් තැරුව්කරණ සමාගම විසින් කොමිස් මුදලක් අය කරන ලද්දේ නම් එම මුදල ද ඇතුලුව අදළ අනෙකුත් තොරතුරු.

(ආ) ගනුදෙනුවේ නිරවද්‍යතාවය පිළිබඳව, අදළ ගනුදෙනුව ආරම්භ කළ පාර්ශ්වයන්ගෙන් ස්වාධීනව සිදුකරන ලද සියුම් පරීක්ෂණයකින් අනතුරුව පසුමෙහෙයුම් අංශය (back office) විසින් තැරුව්කරණ තහවුරුව යැවිය යුතුය.

18. (අ) බලයලත් මුදල් තැරුව්කරණ සමාගම් විසින්, මහ බැංකුව විසින් එම සමාගම් වෙත සපයනු ලබන මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂක පද්ධතිය (Central Integrated Market Monitor - CIMM) මගින් පහත තොරතුරු උඩුගත (upload) කළ යුතුය. වාර්තා කිරීමේ අවශ්‍යතාවය

(i) බලයලත් මුදල් තැරුව්කරණ සමාගම්, ගනුදෙනුකාර පාර්ශ්ව විසින් සපයනු ලබන එක් එක් මිල ප්‍රකාශන/ ලංසු තැබීම් සෑම විනාඩි 15ක් තුළ දී ම සැපයිය යුතු ය. (හෝ අදාළ වාර්තාගත කාලය වන විනාඩි 15 ඇතුළත එවැනි මිල ප්‍රකාශන / ලංසු තැබීම් නොමැති නම් "මිල ප්‍රකාශන නොමැත'' යනුවෙන් සඳහන් කළ යුතු ය.)

(ii) මුදල් තැරැව්කරණ සමාගම් හරහා සිදුවන එවැනි ගනුදෙනු පිළිබඳ තොරතුරු එවැනි ගනුදෙනුවක් සිදු වී විනාඩි 15 කට නොඅඩු කාලයක් තුළ සිදු කළ යුතු ය.

(ආ) මෙහි සඳහන් කාලය ඇතුළත සඳහන් කරන ලද තොරතුරු සැපයීම පිළිබඳව මුදල් තැරුව්කරණ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සහ /හෝ ගනුදෙනු කුටියේ (dealing room) බලධරයා විසින් වගකිව යුතුය.

(ඇ) මධ්‍යම ඒකාබද්ධ වෙළෙඳපොළ නිරීක්ෂක පද්ධතිය (CIMM) අක්‍රීය වන්නා වූ අවස්ථාවලදී මිල ප්‍රකාශන/ලංසු තැබීමේ තොරතුරු හා ගනුදෙනු ෆැක්ස් මගින් එවිය යුතුය. කෙසේ වුවත්, පද්ධතිය නැවත ක්‍රියාත්මක වූ විගස අදළ තොරතුරු පද්ධතියට උඩුගත කළ යුතුය.

(ඈ) මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂක පද්ධතිය අධීක්ෂණය කිරීම;

(i) මධ්‍යම ඒකාබද්ධ වෙළෙඳපොළ නිරීක්ෂක පද්ධතිය හරහා වාර්තා කිරීම බලපත්‍රලාභී මුදල් තැරුව්කරණ ආයතනයන්හි අභ්‍යන්තර හා බාහිර විගණනයන්ට භාජනය කළ යුතුය.

(ii) මෙම රෙගුලාසි සමඟ අනුකූලවභාවය පවත්වාගැනීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතුය.

(iii) වාර්තා කිරීමේ ක්‍රියාවලියෙහි ඕනෑම විෂමාචාරයක් හෝ අක්‍රමිකතාවයක් කල්තියා හඳුනාගැනීම සඳහා කාර්යක්ෂම ප්‍රතිපත්තියක් හඳුන්වා දිය යුතුය.

(ඉ) මෙම රෙගුලාසි නිකුත් කළ දින සිට මාසයක කාලයක් ඇතුළත බලයලත් මුදල් තැරුව්කරුවන් විසින් මධ්‍යම ඒකාබද්ධ වෙළෙඳපොළ නිරීක්ෂක පද්ධතියේ වාර්තා කිරීමේ රාමුව සඳහා අභ්‍යන්තර මාර්ගෝපදේශන ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු අතර එය දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ වෙත ලබාදිය යුතුය. ඉහත සඳහන් රාමුවෙහි කිසියම් වෙනස්වීමක් සිදුවේනම්, එම වෙනස සිදුවූ දින සිට සතියක් ඇතුලත එය දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ වෙත දැනුම්දිය යුතුය.

(ඊ) බලයලත් මුදල් තැරුවිකරණ සමාගම විසින් මාසික කාර්ය සාධන වාර්තාවක්, අදාළ මාසයට පසු එළඹෙන මස වැඩ කරන දින 5 කට නොඅඩු කාලයක් තුළ, මේ සමග අමුණා ඇති ''උපලේඛන iv '' හි සඳහන් පරිදි, දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ වෙත විද්‍යුත් තැපැල මගින් ලැබීමට සැලැස්විය යුතුය. සියලු කාර්තුමය මූල්‍ය ප්‍රකාශ (මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වෙළඳ හා ලාභලාභ ගිණුම හා ශේෂ පත්‍රය) සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අදළ කාල පරිච්ඡේදයට මාසයකට පසුව, දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයා වෙත ලබාදිය යුතුය. මධ්‍යම ඒකාබද්ධ වෙළෙඳපොළ නිරීක්ෂක පද්ධතියට මෙම පහසුකම ලබාදෙන තුරු මෙම මූල්‍ය ප්‍රකාශන දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයා වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය.

මිල ගණන් ලබාදීම

19. බලයලත් මුදල් තැරුවිකරණ සමාගම විසින් විදේශ විනිමය වෙළඳපොල මිල ගණන් (මිල / අනුපාතය) සන්නිවේදනය කිරීමේදී;

(අ) විනිමය අනුපාත වෙනස් කිරීම අරමුණු කරගත් මිල ගණන් (මිල/අනුපාතය) සන්නිවේදනය නොකළ යුතුය;

(ආ) ගරු කිරීමට අපේක්ෂාවක් සහ වෙළඳපොළට සහභාගි වන්නන් නොමග යැවීමේ අදහසින් ප්‍රධානියා හෝ බලයලත් පුද්ගලයන් විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් (මිල/අනුපාතය) සන්නිවේදනය කිරීමෙන් වැළකී සිටිය යුතුය;

(ඇ) පවතින වෙළඳපොළ මිල ගණන් සහ අන්තර් බැංකු කාලීන ගනුදෙනු මත පදනම් ව, විදේශ විනිමය හුවමාරු ගනුදෙනුවලට (FX swaps) අදළ මිල ගණන් (මිල/ අනුපාත) සන්නිවේදනය කළ යුතුය;

ගිණුම් හා අනෙකුත් වාර්තා පරීක්ෂා කිරීම

20. (අ) දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ඔහුගේ දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු විසින් බලයලත් මුදල් තැරුවිකරණ සමාගමක ගිණුම් හා අනෙකුත් වාර්තා /ක්‍රියාකාරකම් ඕනෑම අවස්ථාවක පරීක්ෂා කර බලනු ඇත. එවැනි පරීක්ෂාවකට පහසුකම් සලසනු පිණිස, දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ විසින් හෝ ඔහු බලය පවරන ලද නිලධරයෙකු විසින් හෝ යම් තොරතුරක් ඉල්ලා සිටින සෑම අවස්ථාවකදීම අවසරලත් මුදල් තැරුවිකරණ සමාගම විසින් එම තොරතුරු සැපයිය යුතුය.

(ආ) දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂගේ පරීක්ෂාවන්ට අමතරව, ජාත්‍යන්තර මෙහෙයුම් අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ඔහුගේ දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු විසින් බලයලත් මුදල් තැරුවිකරණ සමාගමක විදේශ විනිමය කටයුතු හා සම්බන්ධ වාර්තා/ ක්‍රියාකාරකම් අවශ්‍ය විටකදී පරීක්ෂා කර බලනු ඇත. එවැනි පරීක්ෂාවකට පහසුකම් සලසනු පිණිස, ජාත්‍යන්තර මෙහෙයුම් අධ්‍යක්ෂ විසින් හෝ ඔහු බලය පවරන ලද නිලධරයෙකු විසින් හෝ විදේශ විනිමය හා සම්බන්ධ යම් තොරතුරක් ඉල්ලා සිටින සෑම අවස්ථාවකදීම අවසර ලත් මුදල් තැරැවිකරණ සමාගම් විසින් එම තොරතුරු සැපයිය යුතු ය. දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ විසින් බලයලත් මුදල් තැරැවිකරණ ආයතනවලට ලබා දෙන උපදෙස්වලට අමතරව අවශ්‍ය පරිදි ජාත්‍යන්තර මෙහෙයුම් අධ්‍යක්ෂ විසින් බලයලත් තැරැවිකරණ ආයතන සඳහා චක්‍රලේඛන නිකුත් කිරීම මගින් විදේශ විනිමය කටයුතු හා සම්බන්ධ උපදෙස් ලබා දෙනු ඇත.

මෙම රෙගුලාසිවලට අනුකූල වීමට අසමත් වීම

21. මෙම රෙගුලාසි ප්‍රකාර විධිවිධානවලට අවනත වීමට අසමත් වීම හා/ හෝ සාවද්‍ය හෝ ව්‍යාජ තොරතුරු ලබාදීම හෝ කිසියම් වැදගත් තොරතුරු සැපයීම පැහැර හැර ඇති විටක, විමර්ශනයකින් අනතුරුව, මුදල් මණ්ඩලය විසින් පහත කරුණු ද ඇතුළත් වූ ක්‍රියාමාර්ගයක් ගනු ඇත.

(අ) එවැනි බලයලත් මුදල් තැරැවිකරණ සමාගමට දැඩි ලෙස අවවාද කිරීම.

(ආ) රෙගුලාසි අංක 17 සහ 18 ට අනුකූලවීමට නොහැකි වූ ඕනෑම අවස්ථාවකට එරෙහිව රු.500,000/- ක ගෙවීමක් සිදු කළ යුතුය.

(ඇ) සාවද්‍ය හෝ වැරදි තොරතුරක් ලබාදීම හෝ තොරතුරු ලබාදීම පැහැර හරින ලද අවස්ථාවක රු.500,000/- ක ගෙවීමක් සිදු කළ යුතුය.

(ඈ) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම 9 වැනි රෙගුලාසියේ සඳහන් ඇතැම් මුදල් තැරැව්කරණ ක්‍රියාකාරකම්වල නියැලීමට නුසුදුස්සකු කිරීම.

(ඉ) මුදල් මණ්ඩලය මගින් නිකුත් කරන ලද බලය පැවරීමේ සහතිකය අහෝසි කිරීම/ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම.

(ඊ) මහ බැංකුව විසින් ගනු ලබන වෙනත් ඕනෑම ක්‍රියාමාර්ගයක්.

22. අවලංගු කරන ලද රෙගුලාසිය යටතේ නිකුත් කරන ලද/ ක්‍රියාත්මක කරන ලද ඕනෑම විධානයක්, මාර්ගෝපදේශයක්, ක්‍රියාමාර්ගයක් හෝ විමර්ශනයක් මෙම රෙගුලාසිය යටතේ නිකුත් කරන / ක්‍රියාත්මක කරන ලද්දක් ආකාරයෙන් ඉදිරියටත් වලංගුවේ සහ බලපැවැත්වේ. සුරැකීමේ විධිවිධාන

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම රෙගුලාසිවල -

(අ) " ඒසීඅයි ආදර්ශ රීති සංග්‍රහය" යන්නෙන් අදහස් විය යුත්තේ කැම්බිස්ට් ඉන්ටර්නැෂනල් සංගමය නොහොත් මූල්‍ය වෙළඳපොල සංගමය (ACI) විසින් සම්මත කරන ලද ස්වයං පාලන ආචාර ධර්ම පද්ධතියයි; අර්ථ නිරූපනය

(ආ) " බලයලත් මුදල් තැරැව්කරණ සමාගම" යන්නෙන් අදහස් විය යුත්තේ මෙම රෙගුලාසි යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද බලය පැවරීමේ සහතිකය දරනු ලබන සමාගමකි;

(ඇ) "මුදල් මණ්ඩලය" යන්නෙන් අදහස් කරන්නේ මුදල් නීති පනතේ 422 වැනි අධිකාරය යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයයි;

(ඈ) "බලය පැවරීමේ සහතිකය" යන්නෙන් අදහස් වන්නේ මෙම රෙගුලාසි යටතේ මුදල් තැව්කරණ ක්‍රියාකාරකම්හි නියැලීමට මුදල් මණ්ඩලය විසින් යම් සමාගමකට ලබාදී ඇති අවසර පත්‍රයයි;

(ඉ) " සේවාදායකයින් " යන්නෙන් අදහස් විය යුත්තේ බලපත්‍රලාභී වාණිජ බැංකු හා අනාගතයේ දී විදේශ විනිමය වෙළෙඳාම් කිරීම සඳහා අවසර ලබාදී ඇති ඕනෑම ආයතනයක්, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ප්‍රාථමික ගනුදෙනුකරුවන්, මූල්‍ය කළමනාකරණ ආයතන, විශ්‍රාම අරමුදල්, ඒකක භාර සමාගම්, රක්ෂණ සමාගම්, ආයතනික භාණ්ඩාගාරයන්, රජයේ ආයතන හා මහ බැංකුව විසින් පිළිගත් අනෙකුත් මූල්‍ය ආයතනයන්ය;

(ඊ) " සමාගම" යන්නෙන් අදහස් විය යුත්තේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත පොදු හෝ පුද්ගලික සමාගමක් ලෙස ස්ථාපිත කර ලියාපදිංචි කරන ලද සමාගමකි.

(උ) " දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ," යන්නෙන් අදහස් විය යුත්තේ මුදල් නීති පනතේ 422 අධිකාරය යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාය;

(ඌ) " ජාත්‍යන්තර මෙහෙයුම් අධ්‍යක්ෂ" යන්නෙන් අදහස් විය යුත්තේ මුදල් නීති පනතේ 422 අධිකාරය යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාය;

(එ) "මූල්‍ය උපකරණ" යන්නෙන් අදහස් විය යුත්තේ දේශීය හා විදේශීය තොග මුදල් බැංකු තැන්පත්, එතැන් සහ ඉදිරි විදේශ විනිමය (ශ්‍රී ලංකා රුපියලට එරෙහි ඕනෑම ස්ථිර හෝ එසේ නොවන මුදලක් සහ ස්ථිර හරස් මුදල්), විදේශ විනිමය හුවමාරු ගනුදෙනු, පොලී අනුපාතික හුවමාරු ගනුදෙනු, මුදල් විකල්ප සහ ඉදිරි ගනුදෙනු, රජයේ හා ආයතනික බැඳුම්කර ඇතුලු ස්ථිර ආදයම් සුරැකුම්පත්, ප්‍රති මිලදීගැනුම් හා ප්‍රති විකුණුම් ගිවිසුම්, ඒක්ෂණ මුදල් හා කාලීන මුදල්, ණයකර, වාණිජ පත්‍ර, පොරොන්දු නෝට්ටු, සුරැකුම්කරණය, මෙම උපකරණවල කිසියම් සංයෝගයක් හෝ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනත් ඕනෑම මූල්‍ය උපකරණයන්ය;

(ඒ) " ගෝලීය විදේශ විනිමය රීති සංග්‍රහය" යනුවෙන් අදහස් විය යුත්තේ විදේශ විනිමය වෙළෙඳපොළෙහි (FX Market) නිරවද්‍යතාවය සහ ඵලදායී ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා පොදු මාර්ගෝපදේශ මාලාවක් සම්පාදනය කිරීම සඳහා විදේශ විනිමය වෙළෙඳපොළෙහි මනා පැවැත්මට අදළ වූ මූලධර්ම පද්ධතියකි. ප්‍රශස්ථ යටිතල පහසුකම් මගින් අනුබලය ලද විවිධ වූ වෙළඳපොළ පාර්ශවකරුවන්ගෙන් යුතු ශක්තිමත්, සාධාරණ, ද්‍රවශීල, විවෘත හා විනිවිද භාවයෙන් යුතු වෙළඳපොළක් ප්‍රවර්ධනය කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. එහිදී පිළිගනු ලැබූ වෙළෙඳපොළ ප්‍රමිතීන් අනුව පවත්නා වෙළෙඳපොළ තොරතුරු පිළිබිඹු වන ආකාරයෙන් තරඟකාරී මිල ගණන් යටතේ විශ්වාසදායීව හා කාර්යක්ෂමව ගනුදෙනු කිරීමට හැකියාව ලැබේ ;

(ඔ) "අභ්‍යන්තර පාලන පද්ධතිය" යන්නෙන් අදහස් විය යුත්තේ සමාගමේ ව්‍යාපාරික කටයුතු ක්‍රමවත් සහ කාර්යක්ෂම ලෙස කරගෙනයාම, කළමනාකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව බව, සහතික කිරීම, වත්කම් ආරක්ෂා කිරීම සහ හැකිතාක් දුරට වාර්තාවල පරිපූර්ණත්වය හා නිරවද්‍යතාව ආරක්ෂා කිරීම යනාදිය සඳහා කළමණාකාරීත්වය විසින් ස්ථාපිත කරනු ලබන මූල්‍ය හෝ මූල්‍ය නොවන සමස්ත පාලන පද්ධතියකි;

(ඕ) " ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධාරී/ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයන් " යන්නෙන් අදහස් විය යුත්තේ එම ආයතනයේ ඕනෑම අධ්‍යක්ෂවරයෙක් (විධායක හෝ වෙනත්) ඇතුලු සෘජුව හෝ වක්‍රව ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම හා පාලනය කිරීමේ බලතල හා වගකීම් සහිත පුද්ගලයන්ය;

(ක) " මුදල් තැරැව්කරණය" යන්නෙන් අදහස් විය යුත්තේ ගෙවූ හෝ ගෙවීමට නියමිත තැරැව් ගාස්තු හෝ කොමිස් මුදලක් සැලකිල්ලට ගනිමින් අතරමැදියෙක් ලෙස කටයුතු කරමින් මුදල් හා විදේශ විනිමය වෙළෙඳපොළ තුළ ගැනුම්කරු සහ විකුණුම්කරු අතර ගනුදෙනු පිළියෙල කිරීමේ නිරත වන ව්‍යාපාරයකි;

(ග) " මෙහෙයුම් කාර්ය මණ්ඩලය " යනුවෙන් අදහස් විය යුත්තේ 9 වැනි රෙගුලාසිය යටතේ සඳහන් කර ඇති මෙහෙයුම්වල සෘජුවම නියැලෙන, බලයලත් මුදල් තැරැව්කරණ ආයතනයේ සේවකයන්ය;

(ච) " ප්‍රධානියා" (Principal) යන්නෙන් අදහස් විය යුත්තේ තමන් විසින්ම අවදානම දරමින් මිලට දීම හා / හෝ මිලදී ගැනීම සිදු කරන ගැනුම්කරු හෝ විකුණුම්කරු වශයෙන් ක්‍රියාකරන ගනුදෙනුවේ පාර්ශ්වකරුවෙකි;

(ජ) " ප්‍රාථමික වෙළෙන්දා" යනුවෙන් අදහස් විය යුත්තේ 1937 අංක 7 දරන ලියාපදිංචි ව්‍යාපාර වස්තු හා සුරැකුම්පත් ආඥාපනතෙහි නිර්වචනය කර ඇති ආකාරයටයි;

(ට) " සුරැකුම්පත්" යන්නෙන් අදහස් විය යුත්තේ ණය සුරැකුම්පත් සහ ව්‍යුත්පන්න ගිවිසුම් ඇතුලුව මූල්‍ය වටිනාකමක් සහිත ගනුදෙනු කළ හැකි මූල්‍ය උපකරණයන්ය;

(ඩ) " ප්‍රකාශිත ප්‍රාග්ධනය" යන්නෙන් 2007 අංක 7 දරන සමාගම් පනතේ ඒ සඳහා දී ඇති සමාන අර්ථය අදහස් වේ;

(ත) " සම්බන්ධිත දුරකථන මාර්ග" යන්නෙන් අදහස් විය යුත්තේ බලයලත් මුදල් තැරැව්කරුවා හා අදළ ප්‍රධානියා අතර අන්තර් සන්නිවේදනය සඳහා පමණක් පිහිටුවා ඇති සන්නිවේදන සම්බන්ධතාවයකි.

පෝරමය : ඩීඕඩී/ එම්බී/ 002

උපලේඛනය I

අයදුම්කරන සමාගම්වල / බලපත්‍රලාභී මුදල් හුවමාරු කරන සමාගම්වල අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන කළමනාකරණ කාර්යමණ්ඩල නිලධරයන් සහ සැලකිය යුතු කොටස් හිමියන් විසින් ඉදිරිපත් කළ යුතු දිවුරුම් ප්‍රකාශය

අයදුම්කරන සමාගමේ නම/ බලපත්‍රලාභී
මුදල් හුවමාරු කරන සමාගමේ නම: ....

දිවුරුම් ප්‍රකාශය

ජාතික හැඳුනුම්පත් අංක / ගමන් බලපත් අංක .... දරන .... (ලිපිනය) හි පදිංචි .... (සම්පූර්ණ නම) වන මම බෞද්ධ/ හින්දු /මුස්ලිම් / ක්‍රිස්තියානි/ කතෝලික ආගමික පුද්ගලයෙකු වශයෙන් ගාම්භීරතා පූර්වකව අවංක ලෙසද සහ සත්‍යගරුකව ද මෙසේ පහත පරිදි ප්‍රතිඥා දෙමි / දිවුරා සහතිකකර ප්‍රකාශ කර[1] සිටිමි.

1. ඉහත සඳහන් සන්තකකරු/ දිවුරුම් ප්‍රකාශක වන මම .... (බලපත්‍රලාභී මුදල් හුවමාරු කරන සමාගමේ නම) හි .... (තනතුර) වෙමි.

2. මම, පහත සඳහන් වෘත්තිමය සහ/ හෝ අධ්‍යාපනික සුදුසුකම් සපුරා ඇති බවට ප්‍රකාශ කරමි/ ප්‍රතිඥා දෙමි.

3. මුදල් හුවමාරු කරන කටයුතු, මූල්‍ය කටයුතු, ව්‍යාපාරික කටයුතු හෝ පරිපාලන කටයුතු හෝ වෙනත් අදාල විෂයයන් පිළිබඳව මා සතු අත්දැකීම් පහත පරිදි වන බවට මම ප්‍රකාශ කරමි/ ප්‍රතිඥා දෙමි.

4. මෙම දිවුරුම් ප්‍රකාශයෙහි අමුණා ඇති උපලේඛන II හි සඳහන් කිසිදු නුසුදුසුකමකට යටත් නොමැති බව මම ප්‍රකාශ කරමි/ ප්‍රතිඥා දෙමි.

1 අදාළ නොවන වචන කපා හරින්න.
බෞද්ධ, හින්දු, මුස්ලිම් සහ වෙනත් කිසියම් ආගමක් අනුගමනය කරන පුද්ගලයන් වශයෙන් ගාම්භීරතා පූර්වකව, අවංක ලෙසද, සත්‍යගරුකවද ප්‍රකාශ කරමි/ ප්‍රතිඥා දෙමි. ක්‍රිස්තියානි සහ කතෝලික භක්තිකයෙකු වශයෙන් දිවුරුම් ප්‍රකාශ කළ යුතු වේ.

මෙහි ඇතුලත් සියලු ප්‍රකාශයන් (සන්තකකරු/ප්‍රකාශකයා හට) කියවා දීමෙන්ද, ඒවායේ අන්තර්ගත කරුණු ඔහු/ ඇය විසින් වටහා ගැනීමෙන් සහ ඒවා සත්‍ය බව පිළිගැනීමෙන් ද අනතුරුව .... දින .... දී මා ඉදිරිපිට අත්සන් තැබූ බව සහතික කරමි.

අදාල පරිදි මුද්දර අලවන්න

මා ඉදිරිපිට දී

සාමදාන විනිශ්චයකාර/
දිවුරුම් කොමසාරිස්

උපලේඛනය II

2018 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසියෙහි, රෙගුලාසි අංක 13 යටතේ වන නුසුදුසුකම්

බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධරයා හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයෙකු හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු ලෙස තෝරා ගැනීමට සහ/ හෝ පත් කිරීමට හෝ එවැනි පුද්ගලයකු එවැනි තනතුරක් දැරීමට හෝ සුදුස්සෙක් නොවන්නේ එවැනි යම් පුද්ගලයෙකු:

(අ) මුදල් තැරැව්කරණ කටයුතු, මූල්‍ය, නීති, ව්‍යාපාර හෝ පරිපාලන කටයුතු හෝ ඒ හා සම්බන්ධ කිසියම් වෘත්තියක් පිළිබඳ, අධ්‍යාපනික හෝ වෘත්තිමය සුදුසුකම් හෝ එලදායී පළපුරුද්දක් ලබා නොමැති නම්;

(ආ) ශ්‍රී ලංකාවේදී හෝ විදේශයකදී යම් අධිකරණයකින් බුන්වත්භාවයෙන් නිදහස් නොකෙරෙනු තැනැත්තකු හෝ බුන්වත්භාවයට පත්වූ තැනැත්තකු ලෙස ප්‍රකාශ කර ලැබ ඇත්නම්;

(ඇ) සදාචාර විරෝධී කටයුතු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් වරදකරුවෙකු කර ඇත්නම්;

(ඈ) යම් අධිකරණයක් විසින් ලබාදෙන ලද තීන්දුවක් හෝ නියෝගයක් ප්‍රකාරව ගෙවිය යුතු වූ ණය මුදලක් ගෙවීමට අපොහොසත් වී ඇත්නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලීසිය, යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීමය සංවිධානයක්, යම් පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීතිය මඟින් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයක් හෝ විසින් වංචාවක්, රැවටීමක් හෝ වංක ක්‍රියාවක් වන යම් ක්‍රියාවක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව සිදුකරන විමර්ශනයකට හෝ විභාග කිරීමකට භාජනය වෙමින් සිටී නම්;

(ඊ) එසේ පත්කරගනු ලැබීමට හෝ තෝරා පත්කරගනු ලැබීමට පෙර අවුරුදු පහළොවක (15) කාලසීමාවක් ඇතුළත යම් අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තිමය සංවිධානයක්, පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීතිය මඟින් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයක් හෝ විසින් වංචාවක්, රැවටීමක් හෝ වංක ක්‍රියාවක් හෝ වෙනත් ඒ සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව වරදකරු කරනු ලැබ ඇත්නම්;

(උ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක් විසින් යම් සංස්ථාපිත ආයතනයක අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධරයෙකු, හෝ වෙනත් නිලධරයෙකු ලෙස සේවය කිරීමෙන් ඉවත කරනු ලැබූ හෝ සේවය අත්හිටුවනු ලැබ ඇත්නම්;

(ඌ) වංචාවක්, රැවටීමක් හෝ වංක ක්‍රියාවක් වන යම් ක්‍රියාවක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාවක වරදකරුවෙකු ලෙස අධිකරණ ක්‍රියාමාර්ගයකට භාජනය වෙමින් සිටින්නෙකු නම්;

(එ) නිසි අධිකරණ බලයක් සහිත අධිකරණයක් විසින් සිහි විකල් තැනැත්තෙකු ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇති තැනැත්තෙකු නම්;

(ඒ) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හා / හෝ ප්‍රාථමික වෙළෙඳ ආයතනයක ප්‍රධාන විධායක නිලධරයෙකු, අධ්‍යක්ෂවරයෙකු හෝ වෙනත් ඕනෑම බලතල සහිත නිලයක් දරන තැනැත්තෙකු නම්.

උපලේඛනය III

අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරි, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයන් හා සැලකිය යුතු කොටස් හිමියන් විසින් ඉදිරිපත් කළ යුතු ප්‍රකාශය (.. දිනට, අදළ ඇමුණුම් ද සමග)

බලපත්‍රලාභී මුදල් තැරැව්කරණ ආයතනයේ නම /
අයදුම්කරණ සමාගමේ නම : ....

1. පෞද්ගලික තොරතුරු

1.1 සම්පූර්ණ නම : ....
1.2 ජා. හැ. අංකය : ....
1.3 විදේශ ගමන් බලපත්‍ර අංකය : ....
1.4 උපන් දිනය : ....
1.5 ස්ථිර ලිපිනය : ....
....
1.6 වර්තමාන ලිපිනය : ....

2. පත්වීම - අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි/ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයා

2.1 අධ්‍යක්ෂ මණ්ඩලයට / වත්මන් තත්ත්වයට /තනතුරට පත්වීම ලද දිනය (විධායක කාර්යයන් ඉටුකරන නිලධරයෙකු නම් කරුණාකර පත්වීම් ලිපියෙහි සහතික කළ පිටපතක් අමුණන්න.)
2.2 තනතුර : ....
2.3 ශ්‍රී ලාංකික පුරවැසියෙකු ද යන වග : ....
2.4 වාර්ෂික වැටුප (වැටුප් විස්තර සමග) : ....

3. සැලකිය යුතු කොටස් ප්‍රමාණයක් හිමි කොටස්කරුවන්ගේ විස්තර

3.1 සැලකිය යුතු කොටස් හිමියෙකු බවට පත් වූ දිනය : ....
3.2 ඔබ ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කරන්නේ ද :
3.3 ඔබ ආයතනයේ කළමනාකාර හෝ විධායක ධූරයක් දරන්නේද : ....
3.4 ආයතනයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සඳහා ඔබ සහභාගි වන්නේද : ....
3.5 ආයතනයේ වැදගත් තීරණ ගැනීම සඳහා ඔබ දයකත්වය ලබා දෙන්නේද :..................................

4. ඥාතීන්ගේ පෞද්ගලික තොරතුරු (උදා: කලත්‍රයා/ දරුවන්)

සම්පූර්ණ නම	ඥාති සම්බන්ධය	ජාතික හැඳුනුම්පත් අංකය/ විදේශ ගමන් බලපත්‍ර අංකය

5. පසුබිම හා මූල්‍ය හා මූල්‍ය නොවන ආයතනයක් සමග ඇති අත්දැකීම්

	ආයතනයේ නම	සේවා කාලය	තනතුරු
(අ)	මූල්‍ය ආයතන (බලපත්‍රලාභී වාණිජ බැංකු, මූල්‍ය සමාගම්, ප්‍රාථමික ගැණුම්කරුවන් ...)		
(ආ)	මූල්‍ය නොවන ආයතන		

6. මූල්‍ය ආයතන හා සම්බන්ධිත ආයතනවල දැනට ඇති කොටස් හිමිකාරීත්වය

මූල්‍ය ආයතන හා එම මූල්‍ය ආයතන හා සම්බන්ධිත ආයතනවල දැනට දරන කොටස් හිමිකාරීත්වයක් තිබේනම්

ආයතනයේ නම	හිමිකාරීත්වය දරන කොටස් ගණන	ප්‍රතිශතය

7. ඥාතීන් ගේ පත්කිරීම්, කොටස් හිමිකම් සහ ව්‍යාපාර ගනුදෙනු

7.1 යම් ඥාතියෙකු ඕනෑම මූල්‍ය ආයතනයක ප්‍රධාන විධායක නිලධාරි, අධ්‍යක්ෂ හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයෙකු ලෙස කටයුතු කරන්නේ නම් එම තොරතුරු;

	මූල්‍ය ආයතනයේ නම	ඥාතියාගේ සම්පූර්ණ නම	දරන තනතුර
1.	බලපත්‍රලාභී වාණිජ බැංකු		
2.	බලපත්‍රලාභී විශේෂිත බැංකු		
3.	බලපත්‍රලාභී මූල්‍ය සමාගම්		
4.	විශේෂිත කල්බදු සමාගම්		
5.	ප්‍රාථමික අලෙවිකරුවන්		
6.	අනෙකුත්		

7.2 යම් ඥාතියෙකු විසින් සෘජුව හෝ වක්‍රාකාරව මූල්‍ය ආයතනවල සැලකිය යුතු කොටස් හිමිකමක් දැනට දරන්නේ නම් එම තොරතුරු;

ඥාතියාගේ සම්පූර්ණ නම	හිමිකාරීත්වය දරන කොටස් ගණන		ප්‍රතිශතය	
	සෘජු	වක්‍ර	සෘජු	වක්‍ර

7.3 ඥාතියෙකු බලපත්‍රලාභී මුදල් තැරැව්කරණ සමාගමක් සමඟ සිදුකරන කවරාකාරයේ හෝ ව්‍යාපාරික ගනුදෙනු තිබේ නම්;

ඥාතියාගේ සම්පූර්ණ නම	ව්‍යාපාරික ගනුදෙනුවේ ස්වභාවය	ගනුදෙනුව සිදුවූ දිනය	සීමාව .... දිනට (රු. මිලියන)	.... දිනට හිඟ මුදල (රු. මිලියන)	සුරැකුම්වල ස්වරූපය හා වටිනාකම (රු. මිලියන)	බලපත්‍රලාභී මුදල් තැරැව්කරණ සමාගමේ ගෙවා නිමකළ ප්‍රාග්ධනයේ ප්‍රතිශතය වශයෙන්

ප්‍රකාශය

ඉහත සඳහන් සියලු තොරතුරු මගේ දැනුමට සහ විශ්වාසයට අනුව සත්‍ය බවටත්, සම්පූර්ණ බවටත් තහවුරු කරමි. ඉහත සපයන ලද තොරතුරු වලට අදාළව, පසුව කිසියම් වෙනසක් වූ වහාම සියලු තොරතුරු බලපත්‍රලාභී මුදල් තැරැව්කරණ ආයතනයට හා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ වෙත දන්වන බවට මම පොරොන්දු වෙමි.

ඉහත තනතුර දැරීම සඳහා කිසියම් නීතියක් මා වළක්වා නොමැති බවත් මෙයින් ප්‍රකාශ කරමි.

දිනය : ....

බලයලත් මුදල් තැරැව්කරණ ආයතනයේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි/ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධාරි/ සැලකිය යුතු කොටස් හිමිකරුගේ අත්සන

අධ්‍යක්ෂවරයෙකුට හෝ ප්‍රධාන කළමණාකරණ කාර්ය මණ්ඩල නිලධරයෙකුට අදාළව ප්‍රධාන විධායක නිලධරයා විසින් සම්පූර්ණ කිරීම සඳහා:

බලපත්‍රලාභී මුදල් තැරැව්කරණ ආයතනයෙහි අධ්‍යක්ෂවරයෙකුගේ හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයකුගේ යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා අදාළ වේ යැයි සැලකිය හැකි ඉහත සපයන ලද තොරතුරු වලට අදාළ අතිරේක පැහැදිලි කිරීම්/ තොරතුරු සහ වෙනත් තොරතුරු

දිනය : ....

ප්‍රධාන විධායක නිලධරයාගේ අත්සන හා නිළ මුද්‍රාව

බලපත්‍රලාභී මුදල් තැරැව්කරණ සමාගමේ ප්‍රධාන විධායක නිලධරයා හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු සම්බන්ධව බලපත්‍රලාභී මුදල් තැරැව්කරණ සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල සභාපති විසින් සම්පූර්ණ කිරීම සඳහා:

බලපත්‍රලාභී මුදල් තැරැව්කරණ සමාගමෙහි ප්‍රධාන විධායක නිලධරයාගේ හෝ සැලකිය යුතු කොටස් හිමියාගේ යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා අදාළ වේ යැයි සැලකිය හැකි ඉහත සපයන ලද තොරතුරු වලට අදාළ අතිරේක පැහැදිලි කිරීම්/ තොරතුරු සහ වෙනත් තොරතුරු

දිනය : ....

අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිගේ අත්සන

…

උපලේඛනය IV

මාසික කාර්ය සාධන වාර්තාව

මුදල් තැරැව්කරණ සමාගමේ නම :………………………………………………

මාසය: ……………………………………………………………………………

	ගනුදෙනු ප්‍රමාණය * (මුහුණත වටිනාකම)		ආදායම	
	එ.ජ.ඩො. අගය	රුපියල්	එ.ජ.ඩො. අගය	රුපියල්
(1) විදේශ විනිමය ගනුදෙනු				
එ. ජ. ඩො./ රුපියල් ස්ථිර පදනමක් මත ගනුදෙනු				
ඉදිරි විදේශ විනිමය ගනුදෙනු				
විදේශ විනිමය හුවමාරු ගනුදෙනු				
හරස් විනිමය				
තැන්පතු				
(2) අන්තර් බැංකු ගනුදෙනු				
ඒක්ෂණ මුදල්				
කාලීන මුදල්				
(3) රජයේ සුරැකුම්පත්				
ස්ථිර පදනමක් මත ගනුදෙනු				
ප්‍රතිමිලදී ගැනීම්/ ප්‍රතිවිකුණුම්				
(4) අනෙකුත් මූල්‍ය උපකරණ				
වාණිජ පත්‍ර				
ණයකර				
(5) අනෙකුත් සේවාවන් (කරුණාකර පැහැදිලි කරන්න)				

* කරුණාකර, විකිණීම හෝ මිලදී ගැනීමක් වශයෙන් ගණුදෙනුවක එක් පාර්ශවයක් පමණක් සැලකිල්ලට ගන්න.

වෙනත් තොරතුරු

(අ)	ප්‍රාග්ධන සංචිත	
(ආ)	බදු පසු ලාභය	
(ඇ)	සේවක සංඛ්‍යාව	
(ඈ)	ප්‍රධාන කළමනාකරණ කාර්යමණ්ඩල නිලධරයන්	1.
		2.
		3.
		4.
		5.
(ඉ)	අධ්‍යක්ෂ මණ්ඩලය	1.
		2.
		3.
		4.
		5.
(ඊ)	සැලකිය යුතු කොටස් හිමියන් (කොටස් හිමි ප්‍රතිශතය සමඟ)	1.
		2.
		3.
		4.
		5.

03-899

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.